**සීමා සහිත ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම - 2022/ 2023**
**-----------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය නොකළ මතය

සීමා සහිත ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගමේ 2023 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

(අ) සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.5,649,161 ක ලාභයක් වූ අතර ඊට අනුරූපීව පෙර වර්ෂයේ ලාභය රු.2,005,792 ක් විය. ඒ අනුව පෙර වර්ෂයට සාපේක්ෂව රු.3,643,369 ක ලාභයේ වැඩිවීමක් නිරීක්ෂණය විය.

(ආ) සමාගමේ පරිපාලන වියදම් පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රු.847,344 කින් හෙවත් සියයට 87.15 කින් ඉහළ ගොස් ඇති අතර මූල්‍ය වියදම් පෙර වර්ෂයේ රු.1,405,681 සිට රු.1,764,593 දක්වා සියයට 25.53 කින් අඩුවී ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාගමේ දළ ලාභය පෙර වර්ෂයේ රු.4,677,882 සිට සමාලෝචිත වර්ෂයේ රු.8,427,866 දක්වා රු.3,749,984 කින් හෙවත් සියයට 80.16 කින් වැඩි වී ඇති අතර සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ලාභය රු.5,649,161 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පිළිබඳ ස්වාධීන තක්සේරුකරු විසින් නිකුත් කරන ලද වාර්තාවට අනුව, 2023 මාර්තු 31 දිනට හානියට පත්, අලුත්වැඩියා කිරීමට සහ අපහරණය කිරීමට එකඟ වූ ජංගම නොවන වත්කම්වල වටිනාකම රු.93,650,000 ක් විය. මෙම ජංගම නොවන වත්කම් විකිණීමට හෝ අලුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. | බොහොමයක් යන්ත්‍ර මේවන විට ධාවන තත්වයේ පවතින අතර ඉතිරි යන්ත්‍ර සූත්‍ර අලුත්වැඩියා කිරීම දැනටමත් ආරම්භ කර ඇත. හැකි ඉක්මනින් සම්පූර්ණ අලුත්වැඩියා ක්‍රියාවලිය නිම කිරීමට අපේක්ෂාකරන අතර ඒවා නැවත භාවිතයට ගැනීම සිදුකරනු ඇත. | අලුත්වැඩියාකර මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා කිරීමට කටයුතු කළයුතුය. |
| (ආ) | සමාගම විසින් සපයන ලද තොරතුරුවලට අනුව**,** 2022/2023 තක්සේරු වර්ෂය තුළදී දමන ප්‍රාදේශීය සභාවට වරිපනම් බදු සඳහා රු.258,698 ක් ගෙවා ඇත. සමාගමේ සේවකයින් සඳහා ලබාදීමට නියමිත නිල නිවාස 233 න් නිල නිවාස 211 ක් තුළ අනවසර පවුල් පදිංචිව සිටින බව නිරීක්ෂණය විය. සමාගම විසින් පදිංචිකරුවන්ට එරෙහිව නීතිමය පියවර ගෙන නොතිබූ අතර ඒවා පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පළාත් පාලන අධිකාරියේ අවශ්‍යතා අනුව ප්‍රාදේශීය සභාව විසින් ගණනය කර ඇති කොටස් හිමියන්ගේ ගිවිසුමේ සඳහන් නිල නිවාස සහ අනෙකුත් ගොඩනැගිලිවලට අදාළ බදු ගෙවා ඇත. කෙසේ වෙතත්, කොටස් හිමියන්ගේ ගිවිසුම අත්සන් කිරීමටත් පෙර සිටම, නිල නිවාස කිහිපයක් හැර බහුතරයක් සිවිල් වැසියන් විසින් දීර්ඝ කාලයක් තිස්සේ ආක්‍රමණයකර තිබුණි. කෙසේ වෙතත්, මෙම නිල නිවාස ඇතුලු උස්බිම් සඳහා වූ ඉඩම් බදු ගිවිසුම මෙතෙක් අත්සන් කර නොමැත. එබැවින්, සමාගමේ නීතිඥවරයාගේ උපදෙස් පරිදි, | නිවාස පවරා ගැනීම, ඉඩම් බදු ගිවිසුම අත්සන් කිරීම සහ අත්සන් කිරීමෙන් පසුව මෙම නිල නිවාස සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සමාගම විසින් සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | මෙම නිල නිවාස වෙනුවෙන් නීතිමය ක්‍රියාමාර්ගයක් ගැනීම සෘණාත්මක බලපෑමක් ඇතිකරනු ලබයි. ඉඩම් බදු ගිවිසුම අත්සන් කිරීමේ කටයුතු සිදුකරමින් පවතින අතර අත්සන් කිරීමෙන් පසු මෙම නිල නිවාස සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සිදුකරනු ඇත. | |
| (ඇ) | කොන්ත්‍රාත්කරුවන් සහ සැපයුම්කරුවන් 06 දෙනෙකු සම්බන්ධයෙන් වූ වසර 5 කට වැඩි කාලයක් තිස්සේ පවතින රු.35,191,312 හිඟ ශේෂයක් ගෙවීමට හෝ කපා හැරීමට කළමනාකාරිත්වය අපොහොසත් වී තිබුණි. තවද, ගෙවීම් ප්‍රමාද වීමට හේතු කළමනාකරණය විසින් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මෙම හිඟ මුදල් පියවීම සඳහා සමාගමට නිසි ඉන්වොයිසි ලැබී නොමැත. කෙසේ වෙතත්, සැපයුම්කරුවන් ඔවුන්ගේ හිඟ මුදල් මෑතකදී තහවුරු කරන ලද අතර තවමත් ඔවුන්ට ගෙවීම් සිදුකර නොමැත. නමුත් වර්තමානයේ කර්මාන්තශාලා පුළුල් කිරීමේ ව්‍යාපෘතිය හේතුවෙන් සමාගම යම් මුදල් හිගයකට මුහුණ දී ඇති අතර මුදල් ප්‍රවාහය වර්ධනය වූ පසු ඒ අනුව සැපයුම්කරුවන්ගේ බිල්පත් ගෙවීම් කරනු ලැබේ. | නියමිත ක්‍රියාවලියන් අනුගමනය කරමින් හිඟ ශේෂයන් ගෙවීමට හෝ කපා හැරීමට කටයුතුකළ යුතුය. |
| (ඈ) | 2023 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව ගොවීන්ගෙන් අයවිය යුතු මුදල රු.75,912,550 ක් වූ අතර, ඉන් රු.33,770,276 ක් සහ රු.21,710,893 ක් පිළිවෙලින් වසර 03 සහ වසර 05 කට වැඩි කාලයක් අය නොවී පැවතුණි. තවද, එම හිඟ ශේෂයන් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමට සමාගමට නොහැකි විය. | අවශ්‍ය තොරතුරු දැනටමත් විගණකවරුන්ගේ පරීක්ෂාව සඳහා ඉදිරිපත් කර ඇත. ඊට අමතරව 2023 ඔක්තෝම්බර් 31 දින වන විට සමාගමට හිඟ මුදල් රු.මිලියන 75.91න් රු.මිලියන 10ක් අයකර ගැනීමට හැකි විය. තවද සමාගම විසින් දිගු කාලීන හිඟ මුදල් සහ නොපියවූ ශේෂයන් සම්බන්ධයෙන් නිරන්තරව අධීක්ෂණය කරයි. ඔබගේ පහසුව සහ පරිශීලනය සඳහා අයකරගැනීම් සම්බන්ධයෙන් වූ විස්තර පහත වගුවේ දක්වා ඇත. | ගොවීන්ගෙන් හිඟ ණය ශේෂයන් අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 මැයි 09 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රසම්පාදන මාර්ගෝපදේශය සහ ඊට අනුරූප ප්‍රසම්පාදන අත්පොත, සමාගම විසින් 2018 සැප්තැම්බර් 05 වැනි දින සමාගමේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය සකස් කර ඇති අතර, ඒ සඳහා භාරකාර මණ්ඩලයේ අනුමැතිය තහවුරු කරන ලියවිල්ලක් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.<br>ඉහත සඳහන් කළ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ සහ අත්පොතෙහි මිලදී ගැනීමේ වටිනාකම රු.1,000,000 ඉක්මවන්නේ නම්, විද්‍යුත් ප්‍රසම්පාදනයට අවසර නැති අතර ලංසු කැඳවීම සහ ලබා ගැනීම තැපෑලෙන් සිදුකළයුතු වුවත්, ඊට පටහැනිව, සමාගම ඔවුන්ගේ මාර්ගෝපදේශයේ 3.2 උප වගන්තියේ විද්‍යුත් ප්‍රසම්පාදන සඳහා අවසර ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු.55,084,923 ක් වටිනා රු.1,000,000 ට වැඩි භාණ්ඩ 10 ක් විද්‍යුත් ප්‍රසම්පාදනය හරහා ලබාගෙන තිබුණි. | ප්‍රකාශිත ප්‍රසම්පාදන මාර්ගෝපදේශය 2018 දී සකස් කර ඇති අතර එම අවස්ථාවේදී පවතින භාණ්ඩ මිල සහ ආර්ථික තත්ත්වයන් සලකා බලන ලදී. කෙසේ වෙතත්, 2019 වසරේ අනපේක්ෂිත ලෙස ආරම්භ වූ COVID-19 වසංගතය අනපේක්ෂිත බිඳවැටීමක් ඇති කළ අතර, එය රටපුරා ආර්ථික කඩාවැටීමකට තුඩු දුන් අතර භාණ්ඩ හා සේවාවල මිල ගණන් සීඝ්‍රයෙන් ඉහළ යාමට සහ වෙළඳපොලේ භාණ්ඩ හිඟයටද හේතු විය. එහි ප්‍රතිඵලයක් ලෙස, වසංගත තත්ත්වය හේතුවෙන් ගමන් සීමා කිරීම් සහ වෙනත් බලපෑම් හේතුවෙන් අත්‍යාවශ්‍ය ලියාපදිංචි තැපැල් සේවාව ඇතුළු සියලුම සේවාවන් තාවකාලිකව අක්‍රීය විය.<br>ඉහත සඳහන් අභියෝග හමුවේ, සැපයුම්කරුවන්ගෙන් ලියාපදිංචි තැපැල හරහා මිලදී ගැනීම් ක්‍රියාත්මක කිරීම අභියෝගාත්මක කාර්යයක් බවට පත් විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ආයතනයේ කළමනාකාරීත්වය මෙම බාධක මධ්‍යයේ වුවද එහි ක්‍රියාකාරීත්වය දිගටම කරගෙන යාමට අධිෂ්ඨානශීලී තීරණයක් ගන්නා ලදී. වසංගත කාලපරිච්ඡේදය තුළ තැපැල් දෙපාර්තමේන්තු සේවාව නොලැබීම හේතුවෙන් ඊට ශක්‍ය විකල්පයක් ලෙස විද්‍යුත් මාධ්‍ය වෙත මාරුවීමට කළමනාකාරීත්වය තීරණය කර ඇත. ආර්ථික පසුබෑම සහ රුපියල අවප්‍රමාණය වීම හේතුවෙන් ආයතනයට බාධාවකින් තොරව ක්‍රියාත්මක වීම සඳහා අත්‍යවශ්‍ය භාණ්ඩ අවශ්‍ය කාල රාමුව තුළ ලබා ගැනීම අතිශය අභියෝගාත්මක විය. හදිසි අවශ්‍යතාව හඳුනා ගනිමින් රුපියල් මිලියනයක සීමාව තුළ විද්‍යුත් මාධ්‍යයක් හරහා මිල ගණන් කැඳවීමට කළමනාකාරීත්වය විසින් අනුමැතිය ලබා දී ඇත. වත්මන් ආර්ථිකයට සහ මිලට වඩා හොඳින් ගැළපෙන පරිදි සමාගම සිය ප්‍රසම්පාදන මාර්ගෝපදේශය මෑතකදී | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට සහ අත්පොතට අනුකූල වීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | යාවත්කාලීන කර ඇත. වත්මන් ආර්ථික තත්ත්වයන්ට ගැළපෙන අයුරින් ආයතනයට මිලදී ගැනීම් සිදු කළ හැකි බව සහතික කරමින් අධ්‍යක්ෂ මණ්ඩලය මෙම වෙනස්කම් සඳහා අනුමැතිය ලබා දී ඇත. | |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ සූර්ය බලශක්ති උත්පාදනයෙන් සහ කාබන් ඩයොක්සයිඩ් නිෂ්පාදනයෙන් (CODS) ආදායම ලෙස පිළිවෙලින් රු.84,218,310 ක් සහ රු.14,760,000 ක් උපයා ගැනීමට සැලසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ සූර්ය බලශක්ති උත්පාදනයෙන් උපයා ඇත්තේ රු.7,796,655 ක් පමණක් වන අතර කාබන් ඩයොක්සයිඩ් (CODS) නිෂ්පාදනයෙන් ආදායමක් උපයා නොතිබුණි. | 2022 ජූලි මාසය වන විට සූර්ය බලශක්ති ව්‍යාපෘතිය අවසන් කර සූර්ය බලශක්ති උත්පාදන ඒකක 3,828,105 ක් ජාතික විදුලිබල පද්ධතියට රු.22 බැගින් ලබා දී 2022-23 මූල්‍ය වර්ෂය සඳහා රු.84,218,310 ක් උපයා ගැනීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය ආරම්භ වූ පසු, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීමට හේතු වූ සිදුවීම් ගණනාවක් සිදු විය. ඒ අතරින් රටේ ආර්ථික අර්බුද, රජයේ සීමා කිරීම් බොහොමයක් LC විවෘත කිරීමට සහ LC/TT ගෙවීම්වලට දැඩි ලෙස බලපෑවේය. එහි ප්‍රතිඵලයක් ලෙස ආනයනික භාණ්ඩ බොහොමයක් නියමිත වේලාවට වැඩ බිමට නොලැබුණි. තවද රට තුළ පැවති ඉන්ධන හිඟය කාර්ය මණ්ඩලය මෙන්ම ද්‍රව්‍ය නියමිත වේලාවට ප්‍රවාහනයට බලපෑ අතර වැඩසටහන ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීමට හේතු විය. එබැවින් ව්‍යාපෘතිය ප්‍රමාද වූ අතර පුරෝකථනය කළ පරිදි සූර්ය බලශක්තිය ජාතික පද්ධතියට ලබා දීමට නොහැකි විය. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය 2022 නොවැම්බර් මස අවසානය වන විට අවසන් කරන ලද අතර ගාස්තු සංශෝධනයෙන් පසු 2022 දෙසැම්බර් 23 දින ආරම්භ කරන ලදී. එම නිසා රු.34.50 ක රේටයකට ජාතික විදුලිබල පද්ධතියට සූර්ය බලශක්තිය ලබාදීමේ ගිවිසුම ලංකා විදුලිබල මණ්ඩලය (CEB) සමඟ අත්සන් කිරීමට හැකි විය. කාබන්ඩයොක්සයිඩ් බලාගාරය ස්ථාපනය කිරීම 2022 ජූනි මාසයේදී ආරම්භ කරන ලදී. කෙසේ වෙතත්, බලාගාරය ඉදිකිරීමේ කටයුතු 75% ක් අවසන් කර ඇත. ආරම්භ කිරීමේ කටයුතු 2024 ජනවාරි අගදී අවසන් කෙරෙනු ඇත. | සූර්ය බලශක්ති උත්පාදනය සහ කාබන්ඩයොක්සයිඩ් නිෂ්පාදනය (CODS) තුළින් ලැබෙන ආදායම වැඩි කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සියලුම තොග ලැබීම් සහ නිකුත් කිරීම් කළමනාකරණය කිරීම සඳහා සමාගම විසින් විධිමත් තොග කළමනාකරණ පද්ධතියක් පවත්වාගෙන යා යුතු වුවද, සමාගම විසින් දැනට භාවිතා කරනු ලබන ERP පද්ධතිය මඟින් තොග කාල විශ්ලේෂණ වාර්තා ලබා ගැනීමට හැකියාවක් නොමැත. එමනිසා යල්පැන ගිය, සෙමින් චලනයවන සහ චලනය නොවන ද්‍රව්‍ය වෙන වෙනම හඳුනා ගැනීමට නොහැකි බවට නිරීක්ෂණය විය. | සමාගම විසින් 2008 වර්ෂයේ සිට Sage Accpac ගිණුම්කරණ පද්ධතිය වැඩිදියුණු කිරීමකින් තොරව භාවිතා කරයි. පවතින පද්ධතිය මඟින් සමාගමේ අවශ්‍යතා සපුරාලනු නොමැති අතර MIS දත්ත සහ වාර්තා සැපයීමට නොහැකි විය. ඇතැම් MIS දත්ත විශ්ලේෂණය කිරීමට සහ කළමනාකරණ අරමුණ සඳහා වාර්තාවන් සකස් කිරීමට කාර්ය මණ්ඩලය විසින් වැඩි කාලයක් ගතකරනු ලබයි. ෙමවනවිට, සමාගම විසින් නව ERP පද්ධතියක් (SAP One) ක්‍රියාත්මක කිරීමේ කටයුතු සිදුකරමින් පවතී. | නව ERP පද්ධතිය ක්‍රියාත්මක කිරීමට කඩිනම් පියවර ගත යුතුය. |
| (ඈ) | මූල්‍ය ප්‍රකාශන සටහන් 2.5 (අ) අනුව, වත්කම්වල අපේක්ෂිත භාවිතය මත පදනම්ව, කළමනාකරණය විසින් ක්ෂය කළ හැකි දේපල, පිරියත සහ උපකරණවල (PPE) ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීවකාලය සෑම වාර්තාකරණ දිනයකදීම සමාලෝචනය කරන බව ප්‍රකාශ කරන ඇත. කෙසේ වෙතත්, සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම් දළ වශයෙන් රුපියල් මිලියන 61.6ක් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) 16 - දේපල, පිරියත සහ උපකරණවල 51 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව එම වත්කම්වල ප්‍රයෝජනවත් ආර්ථිකමය ජීව කාලය නැවත තක්සේරු නොකර සමාගම විසින් අඛණ්ඩව භාවිතා කරනු ලැබේ. LKAS 8 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනස්කම් සහ දෝෂ ප්‍රකාරව ඇස්තමේන්තු දෝෂ නිවැරදි කිරීම සහ මූල්‍ය ප්‍රකාශන තුළ නිවැරදි අගය ඉදිරිපත් කිරීම සිදු කර නොතිබුණි. | සම්පූර්ණ ක්ෂය වූ වත්කම් ඇතුළුව එක් එක් වත්කමේ ප්‍රයෝජනවත් ජීවකාලය සමාගම විසින් සමාලෝචනය කරයි. කිසියම් සැලකිය යුතු වෙනස්කම් හඳුනාගතහොත්, එය මූල්‍යමය වශයෙන් ගළපා LKAS 08 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ දෝෂයන් යටතේ ඒ අනුව අනාවරණය කරනු ලැබේ. කෙසේ වෙතත්, මෙම සම්පූර්ණ ක්ෂය වූ වත්කම් අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම සඳහා සමාගම විසින් සැලකිය යුතු මුදලක් වාර්ෂිකව වැය කර ඇති අතර එම පිරිවැය විස්තීරණ ආදායම් ප්‍රකාශයට අය කරන ලදී. | LKAS 16 සහ LKAS 08 හි දක්වා ඇති ප්‍රතිපාදනයන්ට අනුකූලව කටයුතු කළ යුතුය. |